(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(9).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2021 ජනවාරි 01 සිකුරාදා

---

**2021 මාර්තු 09 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

44/2020

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක හදබිම අධිකාරිය නමින් ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ ප්‍රධාන කාර්යයන් කවරේද;

(iii) එම ආයතනයේ ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ලේ නම හා ලිපිනය කවරේද;

(iv) මෙම ගොඩනැගිල්ලට මාසිකව හා වාර්ෂිකව ගෙවනු ලබන කුළිය කොපමණද;

(v) කෘෂිකර්ම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේම මෙම ආයතනය ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

144/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිරි වර්ෂ 5 සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය පිළිබඳ පුරෝකථනයක් කර තිබේද;

(ii) එසේ නම්, ඉදිරි වර්ෂ 5 සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

(iii) ඉහත සඳහන් කාලය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ජනන සැලැස්මේ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

175/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අවිස්සාවේල්ල, නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතිය විසින් පාලනය කරනු ලබන ග්‍රාමීය බැංකු 24ක, මුදල් තැන්පත් කරන ලද 115,000ක් පමණ වන තැන්පත්කරුවන්ට අයත්වන රුපියල් කෝටි 95ක තැන්පතු මුදල්, 2015 වර්ෂයේ සිට එම තැන්පත්කරුවන්ට ආපසු ලබා දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තැන්පත් මුදල්, අදාළ තැන්පත්කරුවන්ට ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම තැන්පත් මුදල්, අදාළ තැන්පත්කරුවන්ට ලබා දීම සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

237/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ,—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ගම්මිරිස් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම ගම්මිරිස් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම ගම්මිරිස් ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ගම්මිරිස් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

269/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ටැබ් පරිගණක (Tab) ලබා දීමේ වැඩසටහන සඳහා මුදල් වෙන් කරන ලද අයවැය කවරේද;

(ii) එම වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(v) ඉහත ආයතන අතරින් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් ආයතනයේ නම කවරේද;

(vi) ටෙන්ඩර් කැඳවීමේදී ඉදිරිපත් කරන ලද පිරිවිතරයන් කවරේද;

(vii) මේ වනවිට අදාළ ටැබ් පරිගණක මිලදී ගෙන තිබෙද;

(viii) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා උසස් පෙළ ශ්‍රේණි සඳහා උගන්වනු ලබන සියලුම ගුරුවර ගුරුවරියන්ට ටැබ් පරිගණක ලබා දීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

534/2020

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි සීමාසහිත ලංකා සතොස ආයතනයට අයත් ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශාඛාවන් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සීමාසහිත ලංකා සතොස ශාඛා ජාලය අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

585/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු තේ වතු විශාල සංඛ්‍යාවක් මධ්‍යම පළාතේ පිහිටා ඇති බවත්;

(ii) ඒවා දීර්ඝ කාලයක සිට පාඩු ලබන බවත්;

(iii) එම වතුවල සේවය කොට විශ්‍රාමික කම්කරුවන්ගේ පාරිතෝෂික දීමනාව, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම පළාත තුළ පිහිටා ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් තේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල නම් සහ පිහිටා ඇති දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) (i) හි සඳහන් වතුවල පිහිටා ඇති තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට ක්‍රියාත්මකව පවතින කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම කර්මාන්තශාලා අතරින් බාහිර පාර්ශ්වයන්ට බදු දී ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව සහ එම කර්මාන්තශාලාවල නම් කවරේද;

(iv) එම කර්මාන්තශාලා අතරින් මේ වනවිට වසා දමා ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(v) එම කර්මාන්තශාලා නැවත විවෘත කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

658/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දුම්රිය ස්ථාන ක්‍රමානුකූලව සංවර්ධනය කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අලව්ව දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) එහි සංවර්ධන කටයුතු සිදුකරනු ලබන ආයතනයේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලව්ව දුම්රිය ස්ථානයේ සංවර්ධන කටයුතු වර්ෂ ගණනාවක් තිස්සේ ප්‍රමාද වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම සංවර්ධන කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

666/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල නගරාධිපතිවරයා විසින් අත්තනෝමතිකව විනාශ කරන ලද්දේ කුරුණෑගල නගර මධ්‍යයේ පැවති ඉපැරණි ගොඩනැගිල්ලක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එම ගොඩනැගිල්ල පැවති භූමියේ කැනීම් කටයුතු ආරම්භ කර තිබේද;

(ii) විනාශ කරන ලද එම ගොඩනැගිල්ල අයත්වන යුගය කවරේද;

(iii) එම ගොඩනැගිල්ලේ ඇති ඓතිහාසික වටිනාකම කවරේද;

(iv) ගොඩනැගිල්ල පිළිසකර කර සංරක්ෂණය කිරීමට කටයුතු කරන්නේද;

(v) එකී ගොඩනැගිල්ලේ පිළිසකර කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(vi) එම මුදල වැය කිරීමට අපේක්ෂා කරනු ලබන අරමුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

856/2020

ගරු නලින් ප්‍රනාන්දු මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් මේ වනවිට ආරම්භ කර ඇති ශාඛා අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වාර්ෂිකව ලාභ ලබන හා අලාභ ලබන ශාඛා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අලාභ ලබන ශාඛා, ලාභ ලබන තත්ත්වයට පත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) එම අලාභ ලබන ශාඛා වසා දැමීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ මන්ද;

(vi) නව ශාඛා ආරම්භ කිරීමේදී සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

864/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සතු රාජ්‍ය ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය ඔසුසල් පිහිටා නොමැති දිස්ත්‍රික්ක තිබේ නම්, එම දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය රජය සමයේ ගුණත්වයෙන් පහළ සහ කල් ඉකුත් වූ ඖෂධ රාජ්‍ය ඔසුසල් සඳහා නිකුත් කළ බව එතුමිය දන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රාජ්‍ය ඔසුසල් සඳහා නිකුත් කර ඇති ගුණත්වයෙන් පහළ සහ කල් ඉකුත් වූ ඖෂධ ප්‍රමාණය;

(ii) එම ඖෂධවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රාජ්‍ය ඔසුසල් සඳහා කල් ඉකුත් වූ ඖෂධ නිකුත් කිරීමට හේතු;

(ii) එම ඖෂධවල වටිනාකම අදාළ සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට ගනු ලැබූ පියවර;

(iii) වටිනාකම අයකර ගෙන නොමැති සැපයුම්කරුවන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

868/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය උතුර සහ කන්තලේ යන අධ්‍යාපන කලාප තුළ පිහිටි රජයේ පාසල්වල පවතින සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුරු හිඟය හේතුවෙන් ඉහත අධ්‍යාපන කලාප තුළ පිහිටි රජයේ පාසල්වල අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වී ඇති බව එතුමා දන්නේද;

(iii) මේ වනවිට නැගෙනහිර පළාත් සභාව ක්‍රියාත්මක නොවන අතර එම පළාත් සභාවේ පරිපාලනය සෘජුවම අදාළ ආණ්ඩුකාරවරයා යටතේ ක්‍රියාත්මක වන නිසා මෙම ගුරු හිඟය පියවීමට අමාත්‍යාංශය කඩිනමින් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

945/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "ඉටුකම කොවිඩ් - 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(ii) එම අරමුදල පාලනය කරනු ලබන ආයතනයේ නම කවරේද;

(iii) එම අරමුදල පාලනය කිරීම සඳහා රජයේ නිලධාරියකු පත් කර තිබේද;

(iv) එසේ නම්, එම නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අරමුදලේ මේ වනවිට පවතින ශේෂය කොපමණද;

(ii) කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට ඉහත සඳහන් අරමුදලෙන් ලබා දී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඒ සඳහා වියදම් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

947/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වලුක්කියාරු - අරාලි - වේලනයි - පුංගුඩුතිව් හරහා කුරිකට්ටුවාන් දක්වා දිවෙන මාර්ගය, යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රධාන මාර්ගය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ දිග කොපමණද;

(ii) එම මාර්ගය අවසන් වරට ප්‍රතිසංස්කරණය කරන ලද දිනය කවරේද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා ලද ප්‍රභවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ප්‍රධාන ප්‍රවාහන මාර්ගයක් වන ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාව දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත් එතුමා දන්නෙහිද?

(ඈ) (i) එම මාර්ගය දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(ii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේනම්, ඒ මන්ද?

1108/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලගෙදර, මාවතගම (මල්ලවපිටිය) ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය මඟින් ජල සැපයුම් ලබා දීමට අපේක්ෂා කරනු ලබන ආයතන හා නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්වය කවරේද;

(v) ව්‍යාපෘතියේ වැඩ අවසන් කර එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 මාර්තු 10 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

45/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුවන් සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල් තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් රාජ්‍ය ආයතනයේ නම, හිඟ මුදල සහ හිඟ පවතින කාලය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

194/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ක්‍රීඩා සභාව සඳහා පත් කරන ලද නව සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා ඔවුන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂිත සේවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

238/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ,—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ එතනෝල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම එතනෝල් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම එතනෝල් ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට එතනෝල් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

351/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශීය තරඟකාරී නිෂ්පාදන ආනයනය කිරීම හේතුවෙන් දේශීය නිෂ්පාදකයන්ට අහිතකර බලපෑම් එල්ල වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් ඔවුනට තම නිෂ්පාදන අලෙවි කර ගැනීම අපහසු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ලංකා සතොස ආයතනයට අලෙවි ද්‍රව්‍ය ලබා ගැනීමේදී දේශීය නිෂ්පාදකයන්ට ප්‍රමුඛතාවය ලබා දීමට ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) නොඑසේ නම්, ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය සකස් කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

589/2020

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර මහ නගර සභාවේ සේවයේ නියුතු කම්කරුවන් පදිංචි වී සිටින මහයියාව ගම්මානය මහ නගර සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගම්මානය ආරම්භ කරන අවස්ථාවේදී ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව;

(ii) එම අවස්ථාවේදී පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව;

(iii) මේ වනවිට එම ගම්මානයේ පවතින ලියාපදිංචි අංක සහිත විදුලි පහසුකම් ඇති නිවාස සංඛ්‍යාව;

(iv) එම නිවාසවල පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය කාලයේදී මහයියාව ගම්මානය සඳහා වූ නව නිවාස යෝජනා ක්‍රමයක් සැලසුම් කළ බව දන්නේද?

(ii) එසේ නම්, එම නිවාස යෝජනා ක්‍රමය පිළිබඳව විස්තර කරන්නේද;

(iii) එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

667/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහා මාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) A – 17 මාර්ගයේ හේස්ට් තේ කර්මාන්තශාලාව අසලින් ගොන්ගල දෙසට වන මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධනය කරන්නේද;

(ii) එම මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වන්නේද;

(iii) මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා දීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

865/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව ස්ථිර හා අනියම් වශයෙන් කොපමණද;

(iv) 2015 වර්ෂයේදී සංස්ථාවේ ස්ථිර සහ අනියම් සේවක සංඛ්‍යාව කොපමණද;

(v) වර්ෂ 2015 සිට 2019 දක්වා බඳවාගෙන ඇති ස්ථිර, අනියම් සහ කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලයේදී වෙනත් අමාත්‍යාංශවලට මුදා හැර සිටි සංස්ථාවේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ගෙවූ වැටුප් අදාළ අමාත්‍යාංශවලින් ප්‍රතිපූරණය කරගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ආයතනයට බඳවාගෙන සිටි සේවකයන් 98ක්, 2015 මහ මැතිවරණය ඉලක්ක කර ගනිමින් වෙනත් අමාත්‍යාංශ වෙත මුදා හැර සිටි බව දන්නේද;

(ii) එසේ නම්, එම සේවකයන්ට ගෙවා ඇති වැටුප් සහ අතිකාල දීමනාවල වටිනාකම කොපමණද;

(iii) එම මුදල් ප්‍රතිපූරණය කර ගෙන තිබේද;

(iv) එම සේවකයන් මුදා හැරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1020/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා එවකට පැවති වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය භාරව කටයුතු කළ අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම අමාත්‍යාංශයට අයත්ව තිබූ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් කාල සීමාව තුළ සමූපකාර තොග වෙළඳ සංස්ථාව, සීමාසහිත ලංකා සතොස සහ විවිධ සේවා සමූපකාර සමිති විසින් පවත්වාගෙන යනු ලබන වෙළඳ ආයතන සඳහා අවශ්‍ය වන භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත ආයතන සඳහා භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී විනිවිදභාවයකින් කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, යම් අක්‍රමිකතාවයක් සිදු වී තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පූර්ණ විගණනයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 මාර්තු 12 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

46/2020

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා විදුලිය ලබා දීමට වැඩසටහනක් දියත් කර තිබේද;

(ii) පසුගිය යහපාලන රජය බලයට පත්වූ දින සිට මේ දක්වා එම වැඩසටහන යටතේ විදුලිය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පවුල් තෝරා ගැනීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

176/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහා මාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලු පාරේ කොළඹ සිට මොරටුව දක්වා පවතින අධික මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් සිදු කරනු ලබන මුහුදුබඩ මාර්ගයේ (Marine Drive) ඉදිකිරීම් කටයුතු, කොල්ලුපිටියේ සිට දෙහිවල - වාසල පාර දක්වා පමණක් සිදු කර ඇති බවත්;

(ii) එම ව්‍යාපාතියේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමී බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමිවන්නන් සඳහා ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(ii) වන්දි මුදල් ලබා දීමට තවදුරටත් ඉතිරිව තිබේ නම්, එම මුදල් ලබා දීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

195/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නොරොච්චෝල ප්‍රදේශයේ සුළං විදුලි බලාගාරයක් පිහිටා තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බලාගාරය තුළින් ජනනය කරනු ලබන විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම විදුලි බලාගාරයේ ට්‍රාන්ස්ෆෝමරය අක්‍රිය වූ දිනය හා එය නැවත ප්‍රතිසංස්කරණය කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බලාගාරය තවදුරටත් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

239/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ,—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සුදු ළූණු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම සුදු ළූණු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම සුදු ළූණු ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සුදු ලූනු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

352/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ මූලික අරමුණින් හෝටල් සහ ආපනශාලා වෙත මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබා දෙන බවත්;

(ii) සංචාරකයන් නොගැවසෙන ප්‍රදේශවල පිහිටා ඇති ඇතැම් හෝටල් සහ ආපනශාලා වෙතද මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2018 සහ 2019 වර්ෂවලදී හෝටල් සහ ආපනශාලා වෙත මද්‍යසාර විකිණීම සඳහා ලබා දෙන ලද බලපත්‍ර සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බලපත්‍ර ලබා දී ඇති හෝටල් සහ ආපනශාලා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ මුවාවෙන් ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන මද්‍යසාර අලෙවි ස්ථාන වැඩිවීමෙන් මද්‍යසාර භාවිතය ඉහළ යන බැවින් මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය වෙනස් කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

535/2020

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් එක් එක් කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී අස්වැන්න;

(ii) එම වී අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් එක් එක් කන්නයේ දී මිලදී ගත් වී ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ වී අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක්, වී අලෙවි මණ්ඩලය මගින් ඉදිරියේදී මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

605/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව 2020/2021 මහ කන්නයේ වගා කටයුතු සඳහා රසායනික පොහොර නොමිලේ ලබා දෙන්නේද;

(ii) එසේ නම්, වගා කරනු ලබන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iii) වී වගා කරන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iv) එසේ නම්, වී වගා කරනු ලබන එක් අක්කරයක් සඳහා එක් එක් පොහොර වර්ගවලින් ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අතිරේක බෝග වගා කිරීම සඳහා අක්කරයකට ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

659/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල නගරය, ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම නගරයක් බවත්;

(ii) එම නගරය ක්‍රමානුකූලව සංවර්ධනය කළ යුතු බවත්:

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල නගරය ක්‍රමවත්ව සංවර්ධනය කිරීම සඳහා මේ වනවිට සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, සැලසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අරමුදල් සපයා ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම අරමුදල් සපයා ගනු ලබන ප්‍රභවයන් කවරේද;

(iv) කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

723/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක තුළ මේ වනතෙක් ගිනි නිවීම් ඒකකයක් නොමැති වීමෙන් අනපේක්ෂිත ගිනි ගැනීම් සිදුවන අවස්ථාවන්හිදී ජීවිත සහ දේපළ හානි සිදු වන බවත්;

(ii) මන්නාරම නගර සභාව සහ මුලතිව් කරෙයිතුරෙයිපත්තු ප්‍රාදේශීය සභාව සඳහා ගිනි නිවීම් ඒකක ලබා දෙන බවට පොරොන්දු වුවද, මේ වනතෙක් ගිනි නිවීම් ඒකක ලබා දී නොමැති බවත්;

(iii) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල ගිනි ගැනීම් සිදු වන අවස්ථාවන්වලදී වවුනියාවේ සිට ගිනි නිවීමේ රථයක් පැමිණිය යුතු අතර ඒ සඳහා පැය එක හමාරක පමණ කාලයක් ගත වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක සඳහා ගිනි නිවීම් ඒකක ලබා දෙනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

859/2020

ගරු ජගත් කුමාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීමේ වැඩපිළිවෙල යටතේ බස්රථ, දුම්රිය සහ ත්‍රීරෝද රථ යන ප්‍රවාහන මාධ්‍යයන් සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍යවන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ හා පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද ;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු හා කොන්දොස්තර තනතුරුවල පුරප්පාඩු පවතින බව පිළිගන්නේද?

(ii) එසේ නම්, එම තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) තලංගම ඩිපෝව මඟින් ප්‍රවාහන කටයුතු සඳහා යොදවා තිබෙන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රමාණවත් රියදුරන් හා කොන්දොස්තරවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයක් සිටින්නේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නොඑසේ නම්, ප්‍රවාහන කටයුතු සිදුකරන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

869/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— මහා මාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි කුරින්ජාක්කේනි පාලම 2014 වර්ෂයේදී ඇති වූ ගංවතුර හේතුවෙන් විනාශ වූ අතර එදින සිට එම ප්‍රදේශවල ජීවත්වන ජනතාව තාවකාලික පාලමක් භාවිතා කරන බවත්;

(ii) එම පාලම ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ටෙන්ඩර් කැඳවනු ලැබූ අතර පසුව එවකට අග්‍රාමාත්‍යවරයා විසින් එම පාලම ඉදිකිරීම සඳහා මුල්ගල තැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීම සඳහා වූ ටෙන්ඩරය ලබා ගන්නා ලද පුද්ගලයාගේ නම කවරේද;

(ii) එම ටෙන්ඩරයේ වටිනාකම කොපමණද;

(iii) පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iv) එහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

938/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් "ළඟම පාසල හොඳම පාසල" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කළ බවත්;

(ii) ඒ යටතේ කොළඹ අධ්‍යාපන කලාපය තුළ පිහිටි සුසමයවර්ධන විද්‍යාලය, ශාන්ත අන්තෝනි පිරිමි විදුහල, මහාබෝධි විද්‍යාලය, අනුරුද්ධ බාලිකා විදුහල, ශාන්ත අන්තෝනි බාලිකා (ප්‍රාථමික) විදුහල, මුතුවෙල්ල හින්දු විද්‍යාලය සහ මෝදර ආනන්ද විද්‍යාලය යන විද්‍යාල සංවර්ධනය කිරීම ආරම්භ කළ බවත්;

(iii) ඒ සඳහා පසුගිය රජය විසින් මුදල් වෙන් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ කොළඹ 12 - හමීඩ් අල් හුසෛනි විද්‍යාලයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මුල්ගල තැබූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධනය කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත අ(ii)හි සඳහන් පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කිරීමට පියවර ගන්නේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

948/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය සභා බලප්‍රදේශයක් වන නෙඩුන්තීවු දූපතේ ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වන්නේ මුහුදු මාර්ගය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දූපතේ ක්‍රියාත්මක වන "නෙඩුන්තාරකෛ" නැමැති මගී යාත්‍රාවේ සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ තනතුර, පත්වීම් දිනය සහ සේවා පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිලධාරීන්ට කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දී ඇත්තේ කවුරුන්ද;

(ii) විලියම් යේසුදාසන්, ඇන්ටනී රාජ්, සින්දාකුලම් මෙල්කියාස් මිලන්, ඇල්ෆ්‍රඩ් මරියදයාලන්, ඇන්ටනි අමලදාසන්, ඇන්ඩෲස් රකීම්ලයෝන් යන නිලධාරීන්ට, ඔවුන්ගේ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් මත ස්ථිර පත්වීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම ස්ථිර පත්වීම් ලබා දෙනු ලබන දිනය කවරේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

1017/2020

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— මහා මාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) " අයි-රෝඩ්" ව්‍යාපෘතිය රත්නපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් කාපට් අතුරා සංවර්ධනය කිරීමට අනුමත වූ එම දිස්ත්‍රික්කයේ මාර්ගවල දිග කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් කොන්ත්‍රාත්කරු විසින් සංවර්ධනය කිරීම සඳහා ගිවිසුම්ගත වූ මාර්ගවල නම් හා ඒවායේ දිග;

(ii) එම මාර්ග අතරින් මේ වනවිට සංවර්ධන කටයුතු අවසන් කර ජනතා අයිතියට පත් කර ඇති මාර්ගවල නම් හා ඒවායේ දිග;

(iii) මේ වනවිට වැඩ අවසන් කර නොමැති මාර්ගවල නම් හා ඒවායේ දිග;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වැඩ අවසන් කර නොමැති මාර්ග සංවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1109/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, පැල්ලන්දෙණිය ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ඉයෝන් ලංකා මූල්‍ය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනය යටතට පත්කර තිබේද;

(ii) එම තැන්පත්කරුවන් අතරින් වැඩි ප්‍රමාණයක් විශ්‍රාමික රණවිරුවන් බව දන්නේද;

(iii) එම ආයතනයේ මුදල් තැන්පත් කර ඇති තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම තැන්පත්කරුවන්ගේ තැන්පත් මුදල්, නැවත ඔවුන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?